# <u>පුරප්පාඩු</u>

## ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
## (ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය)

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පහත සඳහන් තනතුරේ පුරප්පාඩු සඳහා සුදුස්සන් බඳවා ගැනීමට මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### "විදුලි කාර්මික" තනතුර

**අවශ්‍ය සුදුසුකම් :**

තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් තාක්ෂණික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම හතරට (NVQ 04) නොඅඩු තනතුරෙහි කාර්යයන්ට අදාළ, නිපුණතා සහතිකයක් ලබා තිබීම.

| | | |
|---|---|---|
| **වැටුප්** | : | 72,078/- + අනුමත දීමනා |
| **වැටුප් කාණ්ඩය** | : | PL 3 |
| **තෝරා ගැනීම** | : | සම්මුඛ පරීක්ෂණයක් මඟින් |

**වයස් සීමාව** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 නොඉක්මවිය යුතුය.

**සැළකිය යුතුයි :** මෙම තනතුර සඳහා පුරප්පාඩු පවතිනුයේ බස්නාහිර, දකුණ, උතුර, උතුරු මැද, නැගෙනහිර, වයඹ පළාත්වල වේ. එම පළාත්වල සේවය කිරීමට කැමැත්තක් දක්වන හා ජල සම්පාදන හා මලාපවහන ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති අයවලුන් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ඇත. තෝරා ගැනීමෙන් පසු සේවා ස්ථාන වෙනස් කිරීම පිළිබඳව කරනු ලබන ඉල්ලීම් සළකා බලනු නොලැබේ.

**සටහන** : අදාල ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) විදුලි ක්ෂේත්‍රයෙන් ලබා ගෙන තිබිය යුතුය.

අයදුම්කරුවන් සිය ජීව දත්ත තොරතුරු සහ, එම තොරතුරු සනාථ කිරීම සඳහා අදාල සහතිකපත්වල ඡායා පිටපත් මේ සමඟ අමුණා ඇති අයදුම්පත සමඟ ලියාපදිංචි තැපෑලෙන් 2024.07.08 දිනට හෝ ඊට ප්‍රථම අතිරේක සාමාන්‍යාධිකාරී (මානව සම්පත් කළමනාකරණ), ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, තැ.පෙ. 14, ගාලු පාර, රත්මලාන. ලිපිනයට එවිය යුතුය. **අදාළ සහතිකපත්වල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.** තවද අයදුම්කරන තනතුරු නාමය ලිපි කවරයේ වම්පස ඉහල කෙළවරේ සඳහන් කරන්න.

සාමාන්‍යාධිකාරී
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

තැ.පෙ. 14,
ගාලු පාර,
රත්මලාන.